සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

22 S II

## තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2016

## Third Term Test - Grade 13 - 2016

විභාග අංකය ............................ **භූගෝල විද්‍යාව II** කාලය පැය තුනයි

**උපදෙස්**

එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්වත් තෝරාගෙන ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.

## I කොටස භෞතික භූගෝල විද්‍යාව

01. i. මෙහි දැක්වෙන ලෝක සිතියමෙහි ප්‍රධාන කාන්තාර 8 ක් 1 - 8 දක්වා ලකුණු කර ඇත. ඉන් 4 ක් අක්ෂරය යොදා නම් කරන්න. (ල. 04)




ii. පහත දක්වා ඇත්තේ සුළගේ ක්‍රියාකාරීත්වය ආශ්‍රිත භූ රූප කීපයකි. එහි A සිට E දක්වා දී ඇති රූප සටහන් අනුපිළිවෙළින් දක්වන්න. ඉන් භූරූප 4ක් නිර්මාණය වීමේ ක්‍රියාවලිය පැහැදිළි කරන්න. (ල. 08)



iii. ලෝකයේ හුණුගල් නිර්මාණය වන ප්‍රදේශ 4 ක් නම් කරන්න. (ල. 4)

iv. ලෝකයේ හුණුගල් ආශ්‍රිත භූරූප 3ක් නම් කර ඉන් එකක නිර්මාණය වීමේ ක්‍රියාවලිය පැහැදිලි කරන්න. (ල. 04)

02. i. ශ්‍රී ලංකාවට වර්ෂාපතනය ලැබෙන ක්‍රම 4ක් නම් කරන්න. (ල. 04)




ii. දී ඇති ශ්‍රී ලංකා සිතියමෙහි 1 සිට 5 දක්වා ලකුණු කර ඇති දේශගුණික කලාප අනුපිළිවෙළින් නම්කර ඉන් එක් කලාපයක ප්‍රධාන දේශගුණික ලක්ෂණ පිළිබඳ විස්තරයක් කරන්න. (ල. 08)

iii. ශ්‍රී ලංකාවේ දේශගුණය තීරණය කරනු ලබන කලාපීය සාධක 2ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 04)

iv. වර්තමාන ගෝලීය දේශගුණ රටාවේ වෙනස්කම් ශ්‍රී ලංකාව කෙරෙහි කෙතෙක් දුරට බලපා තිබේද? කාලීන තොරතුරු ඇසුරින් විමසන්න. (ල. 04)

03. i. වර්තමාන ලෝකයට ජල සංරක්ෂණය අවශ්‍ය වී ඇත්තේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ල. 03)

ii. ජල සම්පතේ ගුණාත්මක භාවය අඩු වීමට බලපා ඇති මානුෂ ක්‍රියාකාරකම් 3ක් දක්වා ඒවා උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ල. 06)

iii. ජලය දූෂණය වන විවිධ ආකාර පැහැදිලි කර එයින් ඇති වන ප්‍රතිවිපාක 2ක් නිදසුන් දක්වමින් විස්තර කරන්න. (ල. 05)

iv. ජල සංරක්ෂණ ක්‍රමෝපායන් 3ක් නම් කර වර්තමානයේ ජල සම්පත සුරැකීම සඳහා ඒවා යොදා ගත හැකි ආකාර පැහැදිලි කරන්න. (ල. 06)

04. i. ශ්‍රී ලංකාව සම්බන්ධ වී කටයුතු කරන ජාත්‍යන්තර පරිසර සම්මුති 4ක් නම් කරන්න. (ල. 04)

ii. වර්තමාන ලෝකය මුහුණ පා ඇති පාරිසරික අර්බුද වලට පරිසර සංවිධාන දක්වන අවධානය නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ල. 06)

iii. වර්තමානයේ ලෝකය මුහුණ දෙන පාරිසරික අර්බුද හා ගැටළු නම්කර ඒවායින් 3ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 06)

iv. ශ්‍රී ලංකාවේ පරිසර සංරක්ෂණය සඳහා පිහිටුවා ඇති ආයතන දෙකක් හා ඒවායේ කාර්යභාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 04)

## II කොටස මානුෂ - භූගෝල විද්‍යාව

05. i. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ මෑත කාලීන ප්‍රවණතා 4ක් ලියන්න. (ල. 02)

ii. ශ්‍රී ලංකාවේ පහත දිස්ත්‍රික්කවල ජන සංඛ්‍යාවේ අසම ව්‍යාප්තියට බලපා ඇති සාධක එකිනෙක සසඳමින් පැහැදිලි කරන්න. මුලතිව්, කොළඹ, නුවර එළිය (ල. 06)

iii. ශ්‍රී ලංකා ජන සංඛ්‍යාවේ ප්‍රති ව්‍යාප්තිය සඳහා රජය මගින් ගෙන ඇති පියවර 3ක් පැහැදිලි කරන්න. (ල. 06)

iv. ශ්‍රී ලංකාවේ ජනසංඛ්‍යාව හා සම්බන්ධව වර්තමානයේ පවතින ප්‍රජා විද්‍යාත්මක ගැටළු 2ක් උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ල. 06)

06. i. වර්තමාන ලෝකයේ අධි ජන ඝනත්වයක් පවතින කලාප ඉහත සිතියමෙහි දක්වා ඇත. එම කලාප අනුපිළිවෙළින් නම් කරන්න. (ල. 03)

ii. සිතියම ඇසුරින් ලෝකයේ අඩුම ජන ඝනත්වයක් පවතින ප්‍රදේශ හඳුනාගෙන ඉන් 06ක් නම් කර ජනගහනය හීන වීම කෙරෙහි බලපා ඇති භෞතික සාධක විමසුමට ලක් කරන්න. (ල. 05)




iii. නගර වර්ධනයේ විවිධ අවස්ථා දක්වා නගර වර්ධනයේ උපරිම අවස්ථාව හමුවන නාගරික ජනාවාසය පිළිබඳව උදාහරණ දක්වමින් විමසීමක් කරන්න. (ල. 06)

iv. ලෝකය නාගරීකරණය වීමේදී වර්තමානයේ බටහිර රටවලට වඩා සංවර්ධනය වෙමින් පවතින ආසියාතික රටවල් ඉදිරියෙන් සිටී. එයට හේතු දක්වන්න. (ල. 06)

07. i. ශ්‍රී ලංකාවේ බහුලව පිහිටා ඇති ඛනිජ සම්පත් වර්ග 6ක් ලියන්න. (ල. 03)




ii. ශ්‍රී ලංකාවේ මැණික් ඉල්ලම් බහුලව පිහිටා ඇති ප්‍රදේශ 4 ක් ලංකා සිතියමේ ලකුණු කර ඇත. ඒවා නම් කරන්න. (ල. 04)

iii. ශ්‍රී ලංකාවේ පවතින ඛනිජ සම්පත් නිෂ්පාදන කර්මාන්ත සඳහා උපයෝජනය වී ඇත්තේ අවම වශයෙනි. එයට හේතු දක්වන්න. (ල. 05)

iv. ඛනිජ සම්පත් නිශ්කර්ෂණයේදී භෞතික හා මානව පරිසරයට විවිධ අහිතකර බලපෑම් ඇති වේ. ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් නිශ්කර්ෂණයේදී ඇති වී ඇති ගැටළු පිළිබඳව විමර්ශනය කර විසඳුම් පැහැදිලි කරන්න. (ල. 08)

08. i. ගෝලීයකරණය යන්න හඳුන්වන්න. (ල. 03)

ii. ගෝලීයකරණය නිසා පෘථිවිය විශ්ව ගම්මානයක් බවට පත් වී ඇත. මේ පිළිබඳව ඔබේ අදහස් දක්වන්න. (ල. 05)

iii. ලෝකයේ ආර්ථික, සමාජීය, සංස්කෘතික, අධ්‍යාපනික වැනි විවිධ ක්ෂේත්‍ර කෙරෙහි ගෝලීයකරණය හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය බලපා ඇති ආකාරය විමර්ශනය කරන්න. (ල. 07)

iv. ශ්‍රී ලංකාවේ සමාජ හා ආර්ථික ක්ෂේත්‍රයන්හි නව මුහුණුවරක් ගැනීමට ගෝලීයකරණය බලපා ඇති අයුරු පැහැදිලි කරන්න. (ල. 05)